


# අපි ඉන්දියාව අනුගමනය කරන්නෙ නෑ

## කිරිකට් මාධ්‍ය හමුව

කිරිකට් මාධ්‍ය හමුවට පංදුකට ආරධනා ලැබුනෙ සන්නස පත්තරෙ වෙනුවෙන්. වේලාසනම ආවා ඉස්සරහ පුටුවක් අල්ලගත්ත නිසා තව පැයක් විතර තියෙනවා. අපේ කණ්ඩායම අවසන් වරට ඔස්ට්‍රේලියාව සමග තරග වැදුනෙ ලෝක කුසලාන අවසන් මහා තරගදෙයි. එදා මහේල ඇතුලු අපේ ක්‍රීඩකයො කිසිම විරුද්ධත්වයක් නොපෙන්වා කලුවරේම ගැහුවෙ කිරිකිට් බලධාරීන් එළිපිට ගහන නිසාලු. ඒකටත් බකට් අදින්න ආවෙ ඉන්දියානුවො. ඒ ගොල්ලන්ට තියෙන රුදාව මොකද්ද අපිට කරුවලේ බෝලෙ පේනවනම්. ඒ ගොල්ලන්ගේ කෑගැහිල්ල නිසා ඔස්ට්‍රේලියාව කප් එකයි සල්ලියි මල්ලයි ගත්තට පස්සෙ ෂක්ක එකේ මැල්කම් අයියා පොඩි සමාව පාරක් දැම්මා. මේ ඉන්දියානුවන්ට නම් ඕන්නැති දෙයක් නෑ. අච්චර හොඳට ඔස්ට්‍රේලියාවට කාලයක් තිස්සෙ සෙල්ලම් කර කර හිටිය ස්ටීව් බක්නර්වත් අයින් කරලා දැම්මනෙ. අනේ අපේ දුලිප් මැන්ඩිස් අයියලා නම් ඔයවගෙ කැත වැඩ කරන්නෑ. හැබැයි දැන්නම් තත්වය ටිකක් වෙනස් වෙලාලු. පාර්ලිමේන්තුව අයවැය ඡන්දෙන් අර්ජුන අයියව කිරිකිට් මහපුටුවට තෝරගෙනලු. එයත් ඉන්දියානුවො එක්ක එකතුවෙලා වැඩක් නැති ඒවට ඉස්සර වගේ කෑගහයිද දන්නෑ. මතක නැද්ද අර අහිංසක ඩැරල් හෙයාටයි ඉස්ට්‍රෙස් පිට නිවාඩු පිට ඉදගෙනත් අපේ මැච් එක අම්පයර් කරන්න ආපු රෝස් එමරන්ටයි දීපු විදිය. එකෙන් උනේ කොච්චර අපරාදයක්ද ?

ඔස්ට්‍රේලියාවෙ සේන් වෝන්ට යන්න තිබුන ලෝක වාර්තාව ලංකාවෙ කොහෙද යන මුරලියෙකුට ගියානේ. ඔය මාවන් කාරයත් අර්ජුනගෙ මිනිහෙක්ද දන්නේ නෑ. එහෙම නැත්තම් ඩන්ඩියන් බිලඩීද කියලත් හිතෙනවා. හැම එකටම කෙලින් කතා කරන්න යනවලු - අර මහේල වගේ ෂේප් තියරිය දාගෙන ඉන්නැතිව, ඔස්ට්‍රේලියාවට ඇවිල්ලාත් 50 හතරක් ද කොහෙද ගැහුවා ෂේප් එකේ ඉන්නැතිව. ඒ මදිවට බෝ පැලයක් වගේ ජනාධිපතිතුමා ලඟින්ම ඉන්න අසන්තද මැල් මහත්තයටත් බකට් එකක් දැම්ම. අනේ අම්මපා කිරිකට් ගැහුවට මේ මිනිස-'සුන්ගෙ මොලේ කලඳක්වත් තියෙනවද කියලා. එහෙන් මෙහෙන් පොඩ්ඩක් කඩේ ගිහිල්ලා ෂේප් තියරිය දාලා හිටියනම් අවුරුදු 40ක් 50ක් වුනත් කිරිකට් ගහන්න පුලුවන් එකම ටීම් එක ශ්‍රී ලංකාව කියලා තේරුම් ගන්න මොලයක් නෑ.

අර්ජුන අයියත් ආපු ගමන්ම සල්ලි නෑ කියලා කෑගහනවා. ඒත් ජනාධිපතිතුමාටත් හොඳ නෑ කියලා තේරෙන්නැද්ද මන්දන්නෑ. වර්ල් කප් එකෙන් ලැබුනු සල්ලි ටිකෙන්නේ කිරිකට් බලන්න ප්ලේන් එකෙන් ජනාධිපතිතුමා ඇතුලු කණ්ඩායම වටා ගහපු බිල් ගෙවන්නත් උනේ. මුදල් පුරස්න විසඳ ගන්න හොඳම ක්‍රමය සහෝදර සමාගමක් දාගන්න එකනෙ කිරිකට් පාලනය කරන්න දම්මික අයියයි ප්‍රසන්න මල්ලිත් ඉන්නවා-නෙ.

කොහොම උනත් පංදුකට හිතෙන්නෙම ලංකාවට ජයපිට ජය ගෙනාපු සනා මල්ලියි වාස් මල්ලියි විතරක් නෙවෙයි මුරලි මල්ලිගෙ ඕවර 10ටත් තරුණ කොල්ලො

### CB තරගාවලියෙන් අඩුම තරමෙ තුන්වැනි ස්ථානයවත් ලබාදෙනවා -

### *මහේලගෙන් සහතිකයක්*

ටිකක් ඉන්න ඕන කාලෙ මේක. නැත්නම් ඔය හොයි හොයි හොයි කට්ටියයි කරි කරි කරි අප්පු ආමි කට්ටියයි සේරම පරණ ඒවා අමතක කරලා තදං එම්සජ දෙන්නත් බැරි නෑ. එයාට නම් සමාව බජනය කරන්න ඕනේ. ඒ සේරම අමතක කරලා අපේ කණ්ඩායමට ජයපිට ජය ලැබෙන්න කියලා අප්පු ආමි කට්ටියත් එක්ක එකතු වෙලා හදවතේ ගැඹුරුම තැනින් හා බොක්කෙන් ප්‍රාර්තනා කරනවා.

දන්නෙම නෑ වෙලාව ගියා. සිරිලංකා කණ්ඩායමේ මධ්‍ය සාකාච්චාවටත් වෙලාව හරි. සුපිරි පිතිකරු සනත් නායක මහේල




කලමනාකරු හා පුහුණුකරු හතර දෙනාම ඇවිල්ලා. සන්නස පත්තරය යනුවෙන් මටත් පුරස්නයක් අහන්න පුලුවන්.

මුල්ම ප්‍රශ්නය අපේහඬ මාධ්‍ය ආයතනය වෙනුවෙන් මහේල වෙත යොමු කරනු ලැබුවා.

ඔබ ශ්‍රී ලංකාවට මෙම තරගාවලියෙන් මොන වගේ ජයග්‍රහනයක් ලබාදෙන්න බලාපොරොත්තු වෙනවද ?

**මහේල** :- පලවෙනි හෝ දෙවැනි ස්ථානය ලබාදෙන්න බැරි උනොත් අඩුම තරමෙ තුන්වැනි ස්ථානයවත් ලබාදෙන බවට මා ශ්‍රී ලාංකික ක්‍රීඩා ලෝලීන්ට සහතික වෙනවා.

මී ලඟ ප්‍රශ්නය යොමු උනේ සුපිරි පිතිකරු සනත් වෙත 31 වෙනි නාලකාවෙ ප්‍රවෘත්ති අංශයෙන්.
ඔබ කොපමන කාලයක් ශ්‍රී ලංකා පිලට සේවය කරන්න බලාපොරොත්තු වෙනවද ?

**සනත්** :- ජනාධිපතිතුමා රටට සේවය කරනතාක් කල් මමත් ශ්‍රී ලංකා පිලට සේවය කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඊ ලඟ ප්‍රශ්නය යොමු කලේ හැරල්ඩ් සන් පුවත් පතෙන් කණ්ඩායම් කළමණාකරු වෙතයි.

ලෝක සූරයන් වන ඔස්ට්‍රේලියාව පරාජය කරන එක පහසු කාරියක් නොවෙයි නේද ?

කළමණාකරු :- ඔස්ට්‍රේලියාවේ ප්‍රබල ක්‍රීඩකයන් වන ග්ලේන් මැග්රාත් සේන් වෝන් හා ස්ටීව් බක්නර් දැන් ක්‍රීඩා නොකරන නිසා වෙනදාට වඩා තත්වය වෙනස්. පහුගිය දවසේ ඔස්ට්‍රේලියාවට ලබා දුන්න දරුණු පරාජයෙන් ඒ බව පේනවා
හැරල්ඩ් සන්
ශ්‍රී ලංකාව ඔසට්‍රේලියාව පරාජය කළා...??

කළමාණාකරු
නෑ නෑ අපි නෙවෙයි ඉන්දියාව.

මට කලින් තවත් ප්‍රශ්නයක් යොමුකර හිටියෙ ''' ගුවන් විදුලියේ ක්‍රීඩා අංශයෙන් කණ්ඩායම් පුහුණුකරු වෙතයි.

ලෝකයේ හොඳම පිතිකරු සංගක්කාරත් ලෝක වාර්තාව උසුලන පන්දු යවන මුරලිත් ශ්‍රී ලංකා කන්ඩායම සතු බැවින් තරග ජයග්‍රහනය අපහසු නෑ නේද ?

**පුහුනුකරු** :- ඒ වුණාට ලෝකයේ හොඳම විනිශ්චය කරුවන් හා මාධ්‍ය කරුවන් ඔස්ට්‍රේලියා කන්ඩායම සතු නිසා ඒ වැඩේ පහසු නෑ.

**ප්‍රශ්නය**

ඉතින් මේ විදිහට දිගින් දිගටම ඔසට්‍රේලියාව ශ්‍රී ලංකාව පරාජය කිරීම ගැන කළමණාකාරීත්වය හැටිය ඔබ යම් පියවරක් ගන්නෙ නැද්ද?
**කළමණාකරු**
ගන්නවා ගන්නවා
**ප්‍රශ්නය**
මොකක්ද ඒ පියවර
**කළමණාකරු**
අපි ඔස්ට්‍රේලියාවෙන් ඉල්ලීමක් කරන්න යනවා අපෙන් සමාව ගන්නයි කියලා.. ඔස්ට්‍රේලියාවේ අගමැති තුමා අපෙන් සමාව ඉල්ලනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා..

**කළමණාකරුට තවත් ප්‍රශ්නයක්**
තරගයකට පෙර දා රෑ ක්ලබ් වලයි යාලුවන්ගේ ගෙවල් වලයි කුණු වෙන්න බීලා වමනතේ දාලා පහුවදා තරගයට සහභාගිවන ක්‍රීඩකයන් සම්බන්ධයනේ ඔබ යම් පියවරක් ගන්නේ නැද්ද?
**කළමණාකරු**
ගන්නවා ගන්නවා
**ප්‍රශ්ණාකරු**
අහන්නත් සන්තෝසයි... කියන්න බලන්න ඒ පිළිබඳව යමක්..
**කලමනාකරු**
අපි ඒ ක්‍රීඩකයන්ට උදේට තරගයට යන්න පෙර දෙහි වතුර දෙනවා.. තත්වෙ හුඟක්ම හොඳ නැති අයගෙ ඉස් මුදුණෙ දෙහි ටිකක් ගානවා..

සන්නස පුවත් පත යනුවෙන් පුරස්නයක් නැගීමට පැයකටත් කලින් පැමිනි පංදුකට ඉඩක් ලැබුනෙ අවසන් ප්‍රශ්නය නැගීමටයි. කැමති කෙනෙකුට පිලිතුරු සැපයීමට පොදු පුරස්නයක් මා ඔවුන් වෙත යොමු කලා.

ශ්‍රී ලංකා කණ්ඩායමට තරුණ ක්‍රීඩකයන් හඳුන්වාදීමට කාලයට ඇවිත් නේද ?

**සියල්ලෝම එක හඬින් කේන්තියෙන් මෙන්**

මේ මේ මේ පිස්සු නං කෙළින්න හදන්න එපා අයියා..? ඉන්දියානුවන් අනුගමනය කරන්න අපි කැමති නෑ. අපි ස්වාධීන ස්වෛරී ජාතියක්.. දත්වලට හොම්බට ආවරන දාගෙන ඇගේ නාඩි වැටෙනකල් අපි සටන් කරනවා.

ශ්‍රී ලංකා කණ්ඩායමේ නිර්භීත සටන් කාමිත්වය ඉදිරියේ පංදුක හෙමින්ම මාරු උනෙ පස්සවත් නොබලාය

**පංදුක බිලිංකම**

## SL in Australia ODI Shedule

Fixtures
Commonwealth Bank Series, 2007/08

**February 2008**
Tue 19 - **8th Match** - India v Sri Lanka
Adelaide Oval
Fri 22 - **9th Match** - Australia v Sri Lanka
Melbourne Cricket Ground
Sun 24 - **10th Match** - Australia v India
Sydney Cricket Ground
Tue 26 - **11th Match** - India v Sri Lanka
Bellerive Oval, Hobart
Fri 29 - **12th Match** - Australia v Sri Lanka
Melbourne Cricket Ground

**March 2008**
Sun 2 - **1st Final** - TBC v TBC
Sydney Cricket Ground
Tue 4 - **2nd Final** - TBC v TBC
Brisbane Cricket Ground
Fri 7 - **3rd Final** - TBC v TBC
Adelaide Oval (if required)